# <u>ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව</u>
# <u>නිවාස පාලක තනතුර සඳහා බඳවා ගැනීම</u>

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිවාස පාලක තනතුර සඳහා මෙහි පහත දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ( පුරප්පාඩු සංඛ්‍යාව 01 කි.)

01. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

**1.1** **අධ්‍යාපන සුදුසුකම් :**

1.1.1 සිංහල /දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

1.1.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර) සමත්ව තිබීම.

**1.2** **වෘත්තීය සුදුසුකම් :** ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

**1.3** **පළපුරුද්ද** : නිවාස පාලක හෝ ඊට සමාන හෝ තනතුරක පළපුරුද්දක් තිබීම.අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**1.4** **සේවා මුක්ත භටයන් සඳහා ලබාදෙන අනුග්‍රහ**: අංක 1589/30 හා 2009.02.20 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය අනුව සුදුසුකම් සපුරන ලද වයස අවුරුදු 50 නොඉක්මවූ යුද,ගුවන් සහ නාවික හමුදා සේවා මුක්ත භටයන්ට ඉල්ලුම් කල හැක.

**1.5** **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**1.6** **වෙනත් සුදුසුකම්:**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
II. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසකම් 2019.01.01 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

**1.7** අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර සංවිතගත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පාලනය හා විනය පවත්වා ගෙනයාහැකි මට්ටමේ මනා පෞරුෂයකින් යුක්ත විය යුතුය.

**02.** **වැටුප් පරිමාණය :** 2020.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාරව
**MN -1 - 2016**
**( 27,140-10×300-11×350-10×495-10×660-45,540 )**

**03.** **පොදු කොන්දේසි :**

**3.1** **වයස් සීමාව :** 2019.01.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි(සේවා මුක්ත භටයන් මෙම නිවේදනයේ 1.4 බලන්න)
.
**3.2** තෝරා ගන්නා අයදුම්කරු අදාළ තනතුරෙහි පූර්ණකාලීනව සේවය කලයුතු අතර ඒ සඳහා නේවාසික පහසුකම් දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ.

**3.3.** බඳවා ගන්නා ක්‍රමය :

**3.3.1.** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ගෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:15/90 හි නියම කර ඇති අනෙකුත් සියළු කොන්දේසිවලට යටත්ව නියමාකාරයෙන් සංස්ථාපිත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු පුද්ගලයින් තෝරාගනු ලැබේ.

**3.3.2.** **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

**මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.**

**3.3.3** **සේවා කොන්දේසි:**

සෑම පත්වීමක්ම සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

**3.3.4** අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019/02/15 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක: 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ -07**. යන ලිපිනයට එවිය යුතුය.

**3.3.5** අයදුම්කරුවන් විසින් ඉල්ලුපත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙලවරේ " **නිවාස පාලක තනතුර - 2019.**"ලෙස සඳහන් කළ යුතුය.ඉල්ලුම්පත් සෑම ආකාරයකින්ම සම්පූර්ණ විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලියවිලි හෝ තැපැලේදී නැති වූ බවට කරන පැමිණිලි සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත් ලැබීම ප්‍රමාදවීමෙන් විය හැකි අලාභයක් අයදුම්කරු විසින්ම විඳ දරා ගත යුතුයි. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

**3.3.6** ඉල්ලුම්කරු විසින්තමා දැනුවත්ව ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ අයදුම්කරු හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත්, එසේ නැතහොත් සේවයට නුසුදුසු බව සේවය කරන කාලය තුළ කවර අවස්ථාවකදී හෝ ඔප්පු වුවහොත් ඔහු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වනු ඇත.

දිනය : 2019.01.25

**ධම්මික මුතුගල**
**අධ්‍යක්ෂ ජනරාල්(වැ.බ.)**
**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**
**අංක: 09, පිලිප් ගුණවර්ධන මාවත**
**කොළඹ -07.**

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

**නිවාස පාලක තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. (I) මුලකුරු සමග අගට යෙදෙන නම : ..............................................................................
..............................................................................................................................

(II) මුලකුරුවලින් හැඳින්වෙන නම : ...........................................................................

02. (I) පෞද්ගලික ලිපිනය : ................................................................................................
..............................................................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : ......................................................................

04. උපන් දිනය : වර්ෂය:.....................මාසය :..................... දිනය :...................................

05.2019.01.01 දිනට වයස අවුරුදු:......... මාස :............... දින :.........................

06. දුරකතන අංකය : ස්ථාවර : ................................... ජංගම : ..............................

07 . (අ.) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා/පෙළ) - වර්ෂය

| විෂය | සාමාර්ථය |
|---|---|
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |

අ.පො.ස (උ/පෙළ) - වර්ෂය

| විෂය | සාමාර්ථය |
|---|---|
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |
| ................... | ................... |

(ආ). වෘත්තීය සුදුසුකම්: ..................................................................

(ඇ) . අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද:.......................................................

ඉහත සුදුසුකම් 2019.01.01. දිනට සම්පූර්ණ විය යුතු අතර සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකපත්‍රවල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත්‍ර සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

08. ඔබ උසාවිය ඉදිරියේ කිසියම් චෝදනාවකට වරදකරුවකු වී ඇත්ද ? ඔව් / නැත
(ඔව් නම් විස්තර සපයන්න)

09. අයදුම්කරුගේ සහතිකය :

I. මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

II. මවිසින් කරනු ලැබූ මෙම ප්‍රකාශයන් අසත්‍ය බැව් ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

.......................................... ..................................................

දිනය අයදුම්කරුගේ අත්සන

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .............................නැමැති අය මා පෞද්ගලික ව දන්නා හඳුනන බවත් , ඔහු .................................... දින මා ඉදිරිපිට අත්සන තබන ලද බවත් සහතික කරමි.

........................................................ ........................................................

දිනය සහතික කරන්නාගේ අත්සන

14.දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය:-

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................... මහතා ................................ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .................................................... වශයෙන් ස්ථිර/අනියම්/තාවකාලික තනතුරක ......................... දින සිට සේවය කරන අතර ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා එල්ලවී ඇත/නැත.ඔහුගේ වැඩ,පැමිණීම හා හැසිරීම සතුටුදායකය/අසතුටුදායකය.ඔහු ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයෙන් මුදාහැරිය හැකි/නොහැකි බවත් දන්වමි.

..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

තනතුර..........................................

දිනය............................................